(34) (56)

මගේ අංකය: 4/ගුරුඅා/ශාප්‍ර/17
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
ශ්‍රී ජයවර්ධනපුර, බත්තරමුල්ල.
1993.02.23

චක්‍රලේඛ අංක: 1992/13ඒ

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ (සති අන්ත) දේශන හා සම්මුඛ සැසිවලට සහභාගි වන ගුරු සිසුන් සඳහා රාජකාරි නිවාඩු

ඉහත සඳහන් කාරණයට අදාළව නිකුත් කළ, 4/ගුරුඅා/ශාප්‍ර/17 හා 1992.07.25 දින දරන 1992/13 අංකිත චක්‍රලේඛය අදාළ වේ.

02. එම පාඨමාලාවට සහභාගි වන ගුරු සිසුන් සඳහා පෙර සඳහන් චක්‍රලේඛයෙන් අනුමත කර ඇති රාජකාරි නිවාඩුව, තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලද බැව් දන්වමි.

<u>සංශෝධනය</u>: "ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන එනු ලබන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට සති අන්තවලදී අදාළ දේශන හා සම්මුඛ සැසිවලට සහභාගිවන ගුරු සිසුන්/සිසුවියන්ට එම පාඨමාලාව පැවැත්වෙන සති අන්තවල පෙරදින වන සිකුරාදා හෝ පසු දින වන සඳුදා හෝ යන දින දෙකින් එක් දිනකට රාජකාරි නිවාඩු ලබාගත හැකිවේ."

03. මෙය 1993.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

04. කරුණාකර මෙම සංශෝධනය පිළිබඳව ඔබ පළාතේ අනෙකුත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටද දන්වන්න.

අ.ක./එම්.ඩී.ඩී.පීරිස්
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

කේ.බී.සිරිසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

<u>පිටපත</u>: අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය.

එස්/05.